# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**11 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **ඒකකය 2 - ආණ්ඩුවේ විවිධ ස්තර**

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) අනුරාධපුර යුගය අග භාගයේ පැවති පාලන ඒකකයක් වන්නේ,
1) රජරට 2) අටදහස් රට 3) දොළොස් දහස් රට 4) කෝරළ

(2) පහත රටවල් අතරින් සංවර්ධිත රටක් වන්නේ,
1) නේපාලය 2) බ්‍රිතාන්‍ය 3) ඉන්දියාව 4) පකිස්ථානය

(3) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය අනුව ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික වන්නේ,
1) 15 කි 2) 21 කි 3) 9 කි 4) 58 කි

(4) කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය අනුව සීමිත ඡන්ද බලය හිමි වූ ප්‍රතිශතය වන්නේ,
1) 3% 2) 4% 3) 5% 4) 6%

(5) කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ අනුව සීමිත ඡන්ද බලයෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා වන්නේ,
1) පොන්නම්බලම් රාමනාදන් 2) පොන්නම්බලම් අරුණාචලම්
3) ජොහැන්ස්ගොඩ්රි ෆිල්ප්ස් 4) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරණායක

(6) 1931 හඳුන්වා දුන් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ නිසා ලාංකිකයන්ට දේශපාලන මැදිහත් වීමට වැඩි අවස්ථාවක් ලැබුණි. මේ සඳහා බලපෑ හේතුව නම්,
1) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම 2) සර්වජන ඡන්ද බලය ලබා දීම
3) විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම 4) පළාත්බඳ ජන කොට්ඨාශ ක්‍රමය ඇති කිරීම

(7) ශ්‍රී ලංකාවට ද්විමණ්ඩල පාර්ලිමේන්තුව හඳුන්වා දෙනු ලැබුයේ,
1) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගිනි 2) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගිනි
3) සෝල්බරි ප්‍රතිසංස්කරණ මගිනි 4) මැනිං ප්‍රතිසංස්කරණ මගිනි

(8) උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කයක් නොවන්නේ,
1) අම්පාර 2) මුලතිව් 3) වව්නියාව 4) යාපනය

(9) ව්‍යවස්ථායකය (පාර්ලිමේන්තුව) සතු කාර්යයක් වන්නේ,
1) නීති විවරණය කිරීම 2) නීති පැනවීම
3) රාජ්‍ය සේවය පාලනය 4) රාජ්‍ය මූල්‍ය පාලනය

(10) දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව සඳහා ඡන්ද හිමියන් විසින් තෝරා පත් කර ගනු ලබන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වන්නේ,
1) 225 කි 2) 196 කි 3) 250 කි 4) 198 කි

- පහත 11 – 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(11) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

(12) 1972 – ශ්‍රී ලංකා පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

(13) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

(14) උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් ලියන්න.

(15) ශ්‍රී ලංකාවේ පාලන කටයුතු මෙහෙයවනු ලබන ආණ්ඩු පක්ෂ දෙකක් ලියන්න.

(16) ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(17) බලය විමධ්‍යගත කිරීමෙන් මතුවන ගැටලු දෙකක් ලියන්න.

(18) 1978 – විධායක ජනාධිපති වරයා සතු ව්‍යවස්ථාදායක බලතල දෙකක් ලියන්න.

(19) මහනගර සභාවලට පැවරී ඇති බලතල දෙකක් ලියන්න.

(20) ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට ඔබට දායක විය හැකි ආකාර දෙකක් ලියන්න.

(3) සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු හා පාලකයන් තෝරා ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණයක් ලෙස දැක්වේ.

i) ශ්‍රී ලාංකික පුරවැසියෙකුට ඡන්ද බලයට හිමිකම් ලැබීම සඳහා සම්පූර්ණ කළ යුතු සුදුසුකම් 2 ක් ලියන්න.

ii) සර්වජන ඡන්ද බලයෙන් පාලකයන් තෝරා ගනු ලබන මැතිවරණ දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක සාමාජිකයකු ලෙස කටයුතු කිරීමේදී පැවතිය යුතු පුද්ගල ගුණාංග තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

(4) ශ්‍රී ලංකාව පළාත් පාලන ආයතන ව්‍යුහය තුළින් බලය විමධ්‍යගත කිරීමට කටයුතු යොදා ඇති අතර එය බොහෝ දුරට සාර්ථක වී ඇත.

i) ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන තුනක් නම් කරන්න.

ii) පළාත් සභා වල සහ පළාත් පාලන ආයතන වල ප්‍රයෝජන තුනක් ලියන්න.

iii) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්ය ප්‍රධාන තේමා තුන යටතේ ඊට අයත් කාර්යයන් දෙක බැගින් ලියන්න.

(5) i) මහනගර සභා වලට පැවරී ඇති බලතල හතරක් ලියන්න.

ii) පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ පක්ෂවල වගකීම් තුනක් ලියන්න.

iii) ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස ඔබට පරිසර කළමණාකරණයට දායක විය හැකි ආකාරය කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න.

සැකසුම:- අයි.ඩබ්.ඒ. අයෝමි මිය